# අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රායෝගිකව: විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සම වයසේ මිතුරන් සමඟ හොඳින් අන්තර් ක්‍රියා කරන ආකාරය



"අද අපි පාඩම් වැඩ කරන්නේ අපේ යාලුවන්ගේ පන්ති කාමරයේ," යැයි ප්‍රධාන ගුරුවරිය කීවාය. ළමයි ප්‍රබෝධවත් වී සතුටින් ඉපිළෙන්නට වූහ. ඔවුහු ඉක්මනින් පෙළ සැදී, දුම්රියක් මෙන් ඇදී ගොස් 2 ශ්‍රේණියේ පන්තියක් අසල නතර වූහ.

එය නගරයක ජනප්‍රිය පාසලකි. පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකය, දුබලතා සහිත සිසුන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි ප්‍රධාන ගේට්ටුවකට ආසන්න පන්තිකාමරයක ස්ථානගත කර ඇත. ක්‍රියාශීලී තරුණ උපාධිධාරී ගුරුවරියන් දෙදෙනෙක් ඉතා උනන්දුවෙන් විශේෂ අධ්‍යාපන ඒකකය පවත්වාගෙන යති.

"අප උපාධිධාරී ගුරුවරුන් ලෙස බඳවා ගත් අයයි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් කිව්වා විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ගේ පුරප්පාඩු පුරවන්නට කටයුතු කරන්නටය කියලා. එය අපට අභියෝගාත්මක වුණා. කෙසේ වෙතත්, කලාප අධ්‍යාපන කාර්යාලයෙන් මූලික පුහුණුව ලබා ඉගැන්වීම ආරම්භ කිරීමෙන් පසු අපගේ උනන්දුව වැඩි වුණා. ස්වයං ඉගෙනීමෙන්, අත්හදා බැලීම් මගින් සහ ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් සමඟ සාකච්ඡා කිරීම ඔස්සේ අපි අපේ දැනුම වැඩි දියුණු කර ගත්තා" යැයි ගුරුවරියෝ අප සමඟ සාකච්ඡාවේදී පැවසූහ.

එදින ඔවුන් ඒකාබද්ධ ක්‍රියාකාරකම් පාඩමක් ඉතා සියුම් ලෙස සැලසුම් කර තිබුණි. මෙම ක්‍රියාකාරකම් සැලසුම් කරනු ලබන්නේ හැකියාවන් මට්ටම් නොසලකා සියලුම සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ය. බොහෝ විට එම පාඩම් උගන්වනු ලබන්නේ විවිධ ඉගැන්වීම් ක්‍රම සහ මෙවලම් භාවිතා කරමිනි. එවැනි පාඩම්වල අරමුණ වන්නේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සම්බන්ධයෙන් ආකල්ප වෙනස් කිරීම සහ සාමාන්‍ය පන්තිවලදී ඔවුන්ගේ සම වයසේ මිතුරන් සමඟ ඉගෙනීමට ඔවුන්ට ඉඩ සැලැස්වීමයි.

එදා අපගේ නිරීක්ෂණයට ලක් වුණේ, 2 ශ්‍රේණියේ පන්ති භාර ගුරුවරියගේ සහාය ඇතිව විශේෂ අධ්‍යාපන ගුරුවරියන් විසින් මෙහෙයවන ලද ඒකාබද්ධ ක්‍රියාකාරකම් පාඩමකි. සිසුන් එවැනි කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට හුරුපුරුදු අය වූ බැවින් ඔවුහු උද්‍යෝගයෙන් යුතුව එයට සහභාගී වූහ. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් දසදෙනා කණ්ඩායම් හයකට යොමු කරන ලදි. ඔවුන්ගෙන් එක් අයෙක් හෝ දෙදෙනෙක් බැගින් එක් කණ්ඩායමකට නායකත්වය දුන්හ. කතුරු, පැන්සල්, පාට පැන්සල්, ප්ලැටිග්නම් පැන්, මැලියම් වැනි අත්කම් වැඩ සඳහා අවශ්‍ය සියලුම දේ ඇතුළත් ක්‍රියාකාරකම් කට්ටල ගුරුවරු සිසුන් අතර බෙදා දුන්හ.

විශේෂ අධ්‍යාපන ගුරුවරුන් විසින් ගුරු මේසය මත වර්ණවත් කඩදාසි ගස් සහ පැළ සහිත ගොවිපලක් සූදානම් කර තිබුණි. සිසුන් කළ යුතුව තිබුණේ ගොවිපළ සඳහා සතුන් නිර්මාණය කිරීමයි. සෑම කණ්ඩායමකටම එක් ආදර්ශ සතෙකු ලබා දී තිබුණු අතර, එම ආකෘතියට අනුව තවත් සතුන් සෑදීමට උපදෙස් දෙන ලදි. මෙම අත්කම් ක්‍රියාකාරකම මෙහෙයවිය යුතුව තිබුණේ විශේෂ අධ්‍යාපන සිසුන් විසිනි.



විශේෂ අධ්‍යාපන ඒකකයේ සිසුන් ඒ වන විටත් ඔවුන්ගේ පන්තියේදී මෙම පාඩම කර තිබුණි. ඔවුන්ගේ පන්තියේ මේසයක් මත සාදා තිබුණු ඔවුන්ගේ කඩදාසි ගොවිපළ කඩදාසි සතුන්ගෙන් පිරී තිබුණි. ඒ නිසා ඔවුන් ආත්ම විශ්වාසයෙන් යුතුව පෙරමුණ ගෙන වැඩ ආරම්භ කළහ. අනෙක් සිසුන් ද ඔවුන්ගේ උපකරණ රැගෙන ඔවුන් අනුගමනය කළහ. විශේෂ අධ්‍යාපන සිසුන් නිර්මාණය නිම කරන විට අනෙක් සිසුන් ද ඔවුන්ගෙන් ශිල්පය ඉගෙන ගෙන තිබුණි. පැය භාගයක් ඇතුළත ළමයින් එළදෙනුන්, බැටළුවන්, කිකිළියන්, තාරාවන් සහ හාවුන් ගණනාවක් නිර්මාණය කරන ලදි.

විශේෂ අධ්‍යාපන සිසුන් විසින් සතුන් සාදන ආකාරය නිරූපණය කරන ලදි. අනෙක් සිසුන්ට ප්‍රශ්න ඇති වූ විට, ඔවුන් පිළිතුරු දී ඔවුන්ට උදව් කළහ. එය සරල අත්කමක් වුවද, බොහෝ ඉගෙනීම් අත්දැකීම් ලබාගැනීම එම ක්‍රියාකාරකම තුළින් ලබා ගත හැකි විය. ඔවුන් අත්කම පමණක් නොව, ඔවුන්ගේ සම වයසේ මිතුරන් සමඟ අන්තර් ක්‍රියා කරන ආකාරය ද ඉගෙන ගත්හ.

ශ්‍රවණ ඌනතා සහිත සිසුන් කිහිප දෙනෙකු ද පාඩමට සහභාගී වූහ. එක් ශ්‍රවණ ඌනතා සහිත සිසුවෙකු 2 ශ්‍රේණියට ඒකීයකරණය කර ඇත.

"ඔහු විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සමඟ සංඥා භාෂාව භාවිත කරනවා. ඒ වගේම පන්තියේදී සිසුන් කතාකරන ආකාරය බලා අවබෝධ කරගැනීමට උත්සාහ කරනවා. ඔහු අනෙකුත් සිසුන් සමඟ ඔහුගේ අන්තර්ක්‍රියාවලින් මගින් බොහෝ දේ ඉගෙන ගන්නවා. ඔවුන් එකිනෙකාට උදව් කරනවා," යැයි 2 ශ්‍රේණියේ පන්ති භාර ගුරුවරිය පැවසුවාය.

පාඩම අවසානයේදී, ළමයි සතුටින් ඔවුන්ගේ සත්ව රූප ඔසවා පෙන්වා සතුන්ගේ නම් කීහ. ඉන්පසු, ඔවුන් තම සතුන් ගෙනැවිත් ගුරුවරයාගේ මේසය මත සාදන ලද ගොවිපළෙහි තැබූහ. සියලුම සිසුන් පාඩම රසවිඳින බවක් දක්නට ලැබුණි.

විශේෂ අධ්‍යාපන ඒකකය ඩවුන් සින්ඩ්‍රෝමය, ශ්‍රවණ ඌනතා, ADHD (අවධානය අඩු අධි ක්‍රියාකාරී) සහ බහු ඌනතා සහිත සිසුන්ගෙන් සමන්විත වේ. ගුරුවරු ඔවුන් සඳහා වෙන වෙනම පාඩම් සැලසුම් කරති.

විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ගේ අධීක්ෂණය යටතේ සිසුන් කිහිප දෙනෙකු සාමාන්‍ය පන්තිවලට ඒකීයකරණය කර ඇත.



"මෙය ජනප්‍රිය පාසලක් නිසා පන්තිවල සිසුන් සංඛ්‍යාව වැඩියි. කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා පන්ති කාමරවල ඉඩකඩ මදකම අභියෝගයක්. ඒ වගේම විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අන්තර්කරණ අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු කිරීමට ගුරුවරයාට කාලය සහ නිදහස අඩුයි," යැයි 2 ශ්‍රේණියේ පන්ති භාර ගුරුවරිය පෙන්වා දුන්නාය.

"අද අපි කරපු පාඩම් වැඩෙන්සතුටු වුණා. අපේ අලුත් යාළුවා නිර්මාණය සැදුවා.  අපි යාළුවා කරන දේ කළා. එය කරන්නේ කොහොමදැයි ඔහු අපට කියා දුන්නා," යැයි 2 ශ්‍රේණියේ සිසුවෙක් පැවසීය.

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පන්ති කාමර සමන්විත වන්නේ තනි පන්ති භාර ගුරුවරයකු හෝ ගුරුවරියකගෙනි. ගුරු සහායකවරියක සිටී නම්, පන්ති භාර ගුරුවරයාට/ ගුරුවරියට විශේෂ අවශ්‍යතා සහිත සිසුන් මෙහෙයවීම පහසු වනු ඇත.. කෙසේ වෙතත්, මෙම පාසල අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට ඇපකැප වී සිටින පාසලකි.  ඒකාබද්ධ ක්‍රියාකාරකම් සහිත පාඩම් අන්තර්කරණ අධ්‍යාපනයේ වැදගත් අංගයකි.

අප නිරීක්ෂණය කළ ඒකාබද්ධ ක්‍රියාකාරකම් පාඩමෙන් පෙන්වා දෙන ලද පරිදි එවැනි පාඩම් ඕනෑම විෂය ක්ෂේත්‍රයක ඉගැන්විය හැකිය. ඒවා සෑම වයස් කාණ්ඩයකම සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අනුවර්තනය කළ හැකිය. සියලුම සිසුන් තම සම වයසේ මිතුරන් සමඟ ඉගෙනීමෙන් ප්‍රයෝජන ගත් බව අපට දක්නට ලැබිණි. එසේම, ඌනතා සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් ඒකාකෘතික අදහස් පද්ධති බිඳ දැමීමට සහ අවබෝධය සහ පිළිගැනීම ප්‍රවර්ධනය කිරීමට ද ඒකාබද්ධ ක්‍රියාකාරකම් පාඩම් උපකාරී වේ. සැබෑ ලෝකයේ, දුබලතා සහිත පුද්ගලයින් දිනපතාම දුබලතා නොමැති පුද්ගලයින් සමඟ ජීවත් වෙමින් අන්තර් ක්‍රියා කරති. ඒකාබද්ධ ක්‍රියාකාරකම් පාඩම් සිසුන්ට ලෝකය තුළ සාර්ථක වීමට අවශ්‍ය කුසලතා සහ විශ්වාසය වර්ධනය කිරීමට උපකාරී වේ.